

**'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු**

| 25 වන කාණ්ඩය | බු.ව.2556 දුරුතු මස පුරපසළොස්වකදා ක්‍රි.ව.2013 ජනවාරි මස 26 වන දා | 09 වන කලබ |
|---|---|---|

# ළමා විරුව

දුටුගැමුණු විරු කමට
දහම්පල් අබිමනට
කුමරතුඟු විරු බසට
පණ දෙන්න පොඩි කමට
පොඩි දුවේ - පොඩි පුතේ

ඒ විරුන් තැනු දැයට
රැකවරණ දෙනු පිණිස
ඔවුන් ගිය මඟ ළයට
ගන්න දිරියෙන් සොඳට

නොමැළි ව ම සුරු නැණින්
මෙහෙයවන ඔබ අණින්
වැටෙති සැඩයෝ සැණින්
නැගෙති හෙළයෝ පණින්

**- අනඳ**



# මිනිසාගේ ආලෝකය නුවණයි

බම්බලපිටියේ වජිරාරාමාධිකාරීව වැඩ විසූ
**අතිගරු කඹුරුගමුවේ මහානාම ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි**

නුවණින් තොර ජීවිතය නො බබළයි. සදහට අඳුරුයි. මෙ ලොව දියුණුව හෝ පරලොව දියුණුව හෝ ඔහුට ලබන්නට නුපුළුවන. නුවණින් විමසා කටයුතු කිරීම දෙලොව දියුණුවට හේතු වෙයි. නුවණැති මිනිසාගේ ක්‍රියාවෝ කාටවත් අයහපත පිණිස නොපවතිත්. නුවණ මිනිසාට ආලෝකයකි. අන්ධකාර රාත්‍රියෙක්හි එළිය මිනිසාට ආලෝකයක් ගෙන දෙයි. (යනපාර) ගමන් මාර්ගය යථා තත්ත්වයෙන් පෙනෙන්නේ එළියෙන් ය. එමෙන් ම මිනිසාගේ මෝහාන්ධකාරය දුරු කරන්නේ ඥාණාලෝකයෙනි.

එබැවින් ඥාණය දියුණු කරන්නට උත්සුක වීම තමා ලොකු ම කාර්යය. ''පඤ්ඤා නරානං රතනං'' නුවණ මිනිසුන්ට රත්නයක් යැයි අප බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. මෙලොව ඇති සියලු ම රන් රුවන් ආදි හැම රුවනකට වඩා අගනේ තම නුවණයි. නුවණැති පුද්ගලයන්ට හැම රත්න ජාති ම ළඟා කරගන්නට ශක්තියක් ලැබෙන්නේ ය. අන්ධයකුට අගනා රුවනක් පා ළඟ තිබුණත් ඔහුට එයින් වැඩක් නොවන්නේ ය. අන්ධයනට යමක ඇති තතු නොපෙනෙයි. යමක් විචාරන්නට ශක්තියක් ද ඔහුට නැත. විචාර බුද්ධිය හෙවත් යමක ඇති තතු හැම දෙනාට ම දැනගන්නට පුළුවන්කමක් නැත. විචාර බුද්ධියෙන් තොර ජීවිතය කිසිම බැබළීමක් නැත. ජීවිතය බබළන්නේ ඔහුගේ බුද්ධි ප්‍රභාවයේ බලයෙනි. එබඳු බලයක් දෙලොවට ම යහපත සලසා දෙන්නේ

ය. බුද්ධිය වවන්නට දියුණු කරන්නට තෝතැන්නක් වුවමනා ය. ශිල්ප ශාස්ත්‍ර නමැති තෝතැන්නෙහි බුද්ධිය (ප්‍රභාවය) වවන්නට (දුවවන්නට) හැකි ය. කුඩා කලැ පටන් බුද්ධි වර්ධනය කරන්නට පටන් ගැනීම නුවණට හුරු ය. ළපටි කාලයේ පටන් ගුණ නුවණ වඩන තැනැත්තා අපරාධ කරන්නෙ නැත. දරුවකුට දිය යුතු එක ම වස්තුව නම් යහපත් ඉගැනීමයි. යහපත් ඉගැනීමක් නොලත් මිනිසා අන්ධ හස්තියකු වාගේ ය. ඔහුට කිසිදු මඟක් පෙනෙන්නේ නැත. මෙලොව සමහර මිනිස්සු අන්ධයන් මෙන් ක්‍රියා කෙරෙති. සුමඟ හෝ නොමඟ ඔවුනට තේරුම් ගන්නට ශක්තිය නැත. නුවණින් විමසා බලන්නවුන්ට මිස අන්‍යයන්ට යහමඟ නො තේරෙයි.

මෙලොව පරලොව යන දෙක්හිම බොහෝ මනුෂ්‍යයෝ පිරිහෙති. මිනිසත් බව ලැබෙන්නේ පෙර කුශල බලයෙනි. ඔහුට නුවණක් ලැබීමෙන් සිදුවන්නේ මිනිසත් බව ආලෝක වීමකි. තිරිසන් සත්ත්වයනට නියම නුවණක් නැත. ඔවුහු අහේතුක ප්‍රතිසන්ධිකයෝ ය. ඔවුන්ගේ ජීවිත අන්ධකාරයි. කිසිම සතෙක් අමුතු විශේෂ දියුණුවකින් දියුණුවන්නේ නැත. පණ්ඩිතකමකින් හෝ ධනවත්කමකින් හෝ ගුණවත්කමකින් හෝ දියුණුවූවෙක් අපට දක්නට අහන්නට නැත. හරක් (පට්ටියක) රළක සිටින ගවයෝ එකවාගේ ම ගොනුන් මිස, නුවණැති පණ්ඩිත ගොන්නු නොසිටිත්. ඔවුන්ගේ ස්වභාවය එකසේ ය.

මිනිසුන් අතර නානාවිධ මනුෂ්‍යයෝ සිටිති. ඔවුන්ගේ අදහස් ගති පැවතුම් නානාප්‍රකාර ය. මෙලොව පුදුම දේ නිෂ්පාදනය කරන්නෝ මනුෂ්‍යයෝ ම ය. අද ශිල්ප ශාස්ත්‍ර ඥානය පුදුම එළවනසේ පුරුදු පුහුණු කර තිබෙන බව ලෝකය දෙස එබී බැලීමෙන් වැටහේ. පෙර අපර දෙදිගම මනුෂ්‍යයෝ පුදුම එළවන සේ (ශාස්ත්‍ර) යන්ත්‍ර සූත්‍ර නිර්මාණය කරති. දියුණු මිනිස් සිතින් පුදුම දේ කරන්නට පුළුවන් ය. ලෝකයේ ඉහළම තත්ත්වය වූ බුදු පදවිය ද ලබන්නේ නුවණින් ය. බුදු බව සිදු කැරැ දෙන්නටත් නුවණ ඉතාම ඉවහල් ය. බොහෝ දීර්ඝ කාලයක පටන් නුවණ දියුණු කැර ගැනීමෙන් ම පුදුම දේ ඇතිකර ගන්නට පුළුවන් ය. බුදු බව අත්‍යුත්තම පදයෙකි. මේ තත්ත්වය ලබන්නට කිය නොහැකි කාලයක පටන් නුවණැස දියුණු කරගන්නට වුවමනා ම ය.

''පඤ්ඤාය පරිසුජ්ඣති '' පිරිසුදු බවත් නුවණින් ම ලබා ගත යුතු ය. මෙලොව පිළිබඳවත් පරලොව පිළිබඳවත් පිරිසුදුකම ලබන්නේ නුවණ කරණ කොට ගෙන ය. ගෙවල් දොරවල් ඇඳුම් පැළඳුම් යන සියල්ලම නුවණැති තැනැත්තේ හොඳින් පිළියෙල කරන්නේ ය. පණ්ඩිත මිනිසා සිටින ස්ථානය හැම කරුණෙන් ම බබළයි. දිනෙන් දිනම දියුණු වෙයි.

අපණ්ඩිත මනුෂ්‍යයාගේ ක්‍රියාවෝ ශෝභන නොවෙත්. නුවණැස ඔහුට නැත. එබැවින් හේ නුවණින් කල්පනාකර බලන්නේ නැත. තිරිසන් සතෙක් නුවණින් විමසා බලා කරන සිරිතක් නැත. ඔහුගේ ක්‍රියා ප්‍රසාදය එළවන්නේ නැත. තිරිසන් වූ කිසිම සතකුට පිරිසුදුකමක් ගැන අදහස් වන්නේ නැත.

මිනිසාගේ ඥානය දියුණු කරන්නට වඩන්නට තැන් බොහෝ ය. චිත්ත ශුද්ධිය ඇතිකර ගැනීම කාය ශුද්ධියට වඩා උසස් ය. චිත්ත ශුද්ධිය ඇති කරන්නට පුළුවන් ක්‍රමය මෙසේ ය. මිනිස් සිත්හි ඇතිවන කෙලෙස් වූ රාග, ද්වෙෂ මොහ ආදී කෙලෙස් සුන් කරන්න පුළුවන් වීමෙන් හිත පිරිසුදුව තබා ගන්නට පුළුවන් ය. කොතෙක් සුවඳ විලවුන් ඇඟේ ගෑමෙන් හෝ ගංගා නම් වූ මහා ගංගාවලින් නෑමෙන් හෝ නියම ශුද්ධියක් නො ලැබේ. ශරීරයේ ඇති කුණු කසළ දාඩිය ආදී අපවිත්‍ර දේ සේදීමෙන් නෑමෙන් නැතිවන්නට පුළුවන් ය. හිතේ ඇති කෙලෙස් මල කිසිම වතුරකින් හෝ සුවඳකින් සෝදා හරින්නට නුපුළුවන. ශීල සමාධි ප්‍රඥා නැමැති ජලයෙන් කෙලෙස් මල සෝදා හරින්නට පුළුවන. රාගාදි කෙලෙස් මල කිය නොහැකි කාලයක් මුළුල්ලේ පටන් පවතින දෙයකි.

සංසාර ප්‍රවෘත්තිය පවත්නේ කෙලෙස් මල වලිනි, කෙලෙස් මුල් වූ ලෝභ , ද්වෙෂ, මොහ, යන මේ ධර්මයන් තිබෙන තාක් සත්ත්වයෝ සංසාරයෙහි ම පවතිත්. සියලු කෙලෙස් මූලොච්ඡින්න කළොත් එයින් තමාට ඉහළ ම ජය ලැබෙයි. කෙලෙස් මාරුව යම්තාක් කල් තිබේද ඒතාක් සත්ත්වයනට ශාන්තියක් නැත. නොයෙක් විදියේ දුක් ඇති වන්නේ ය.

**(බෞද්ධ ළමයා 1955 වෙසක් කලඹිනි)**



# දියුණු වන්නේ කෙසේ ද?

මහරගම සිරි වජිරඤාණ ධර්මායතනයේ ප්‍රධානාචාර්ය
**ශාස්ත්‍රපති පණ්ඩිත පූජ්‍ය මහඔය අනුරුද්ධ ස්වාමීන් වහන්සේ විසිනි**

දියුණුව කොටස් දෙකකි. ඒ ගුණ දහමින් දියුණුවීම හා ලෞකික දියුණුව යනුවෙනි. මේ දෙ අංශයෙන් ම දියුණු වන්නාට උපදේශය අතිශයින් ම උපකාරී වෙයි. යමෙක් යම් උපදේශයක් දෙන්නේ ලෝකය පිළිබඳ තමන් දුටු අත්දැකීමක් ඇසුරෙනි. අපට හැම දෙයක් පිළිබඳව ම අත්හදා බැලීමට කාලය නොමැති හෙයින් වැඩිහිටියන් මව්පියන් ගුරුවරුන් හා භික්ෂූන් වහන්සේලා ලබාදෙන ඒ උපදෙස් අනුව කටයුතු කිරීම තම ජීවිතය අර්ථවත් කැර ගැනීමට සැපවත් කැර ගැනීමට හේතු වෙයි.

අද ලෝකය විවිධයි. විෂමයි. ඇසුරට ලැබෙන්නේ ද දියුණුවට නොව, ආධ්‍යාත්මික හා ලෞකික යන දෙ අංශයෙන් ම පිරිහීමට මං පෙන්වන්නෝ ය. මුදල් උපයන්නා ඒ මුදල අය වැය දැන නිසි පරිදි පරිහරණය කරන්නේ නම්, ඔහුගේ ආර්ථිකය දියුණුවට පත් වෙයි. යමෙක් තමන් උපයන ධනයෙන් මිතුරන් හා එක්වී කා බී විනෝද වීම ම තම පරමාර්ථය කරගතහොත් ඔහුට ආර්ථික වශයෙන් දියුණුවක් ලැබීම ඉතා උගහට ය. එවැනි ඇතැම්හු යමෙක් තමන්ට ලබා දෙන උපදෙස් පිළිබඳව ද තැකීමක් නොකරති.

යමෙක් යමෙකුගේ වරදක් අඩුපාඩුවක් දුටුවිට ඔහු කෙරෙහි අනුකම්පාවෙන් මෛත්‍රියෙන් එහි ආදීනවය දෝෂය පෙන්වා දෙයි ද, හේ කලණ මිතුරෙකි. ඔහු තමාට වටිනා නිධානයක් පෙන්වා දෙන්නෙකු මෙන් සැලකිය යුතු බව බුදුපියාණෝ වදාළහ. එවැනි කලණ මිතුරන් ඇසුරු කිරීම ලෞකික ලෝකෝත්තර යන දෙ අංශයෙන් ම දියුණුවට හේතු වෙයි.

පැහැදිලි අධිෂ්ඨානයක් ඇතිව කලට වේලාවට වැඩ කරන්නෙකුට ඉතා ටික කලකින් උසස් දියුණුවක් ලබාගත හැකි ය. දියුණු වන්නෙකු විසින් තමාට මුල්කල පුරුදු වූ නරක දුර්වලකම් දැන් ජීවිතයේ බලපාන්නට ඉඩ නොදිය යුතු ය. යමෙක් ඉතා හොඳින් සිතුවොත් තමාගේ ඕනෑම වරදක් හෝ දුර්වලකමක් නැතිකර ගත හැකි ය. ඉතා හොඳින් තේරුම්ගත යුත්තේ තමාගේ ස්වභාවය නුවණ හා චරිතය යන මේවා ය. තමා තුළ පවත්නා නරක ගති ඉවත් කරන්නට නම් හොඳ සිරිත් පුරුදු කැරගත යුතු ය. ජීවිතයේ අමාරුකම් වලින් වැළකීමට ක්‍රියා කරනවාට වඩා ඒවා දිනීමට වැඩ කළ යුතු ය. එවිට තම හිත හා කය ශක්තිමත් වෙයි. හැඟීම් දමනයකින් තොරව පුද්ගලිකත්වය දියුණු කැර ගත නොහැකි ය. එසේම යමෙක් යම් උපදේශයක් දෙනවිට තම ක්‍රියාව නිවැරැදි බව ඔප්පු කිරීමට වෙහෙසෙන්නේ තම දුර්වලකම වසා ගැනීමට ය. එයින් පිරිහීමක් විනා දියුණුවක් නොවෙයි.

නොසිතන දෙය සිදුවීමත් සිතන දෙය නොසිදු වීමත් ලෝකයේ ස්වභාවයයි. ඉවසීමෙන් සැනසීම ලැබෙන බව පිළිගත යුතු ය. අනුන්ගේ වරදක් දුටුවිට එය ඔහුගේ සහජ දුර්වලකමක් බව සිතා අනුකම්පා කරනවා විනා තරහවීම හෝ කලකිරීම යුතු නැත. ගින්නක් නැතිව දුමක් ඇති නොවෙයි. එය සාමාන්‍ය තර්කයකි. තමාට යමෙක් දොස් කියනුයේ තමාගේ යම් අඩුපාඩුවක් වරදක් ඇතොත් පමණි. එබැවින් තම දොසක් අනුන් කියනවා ඇසී කෝප නොවී එහි සත්‍යයක්

තිබේදැයි නුවණින් විමසා බැලිය යුතු ය. පිරුණු කළයේ දිය නො සෙලවෙයි. අඩු කළේ දිය සෙලවෙයි. දියුණු වූ පමණට මිනිසා ද සන්සුන් වෙයි. පිරිහුණු පමණට මිනිසා නොසන්සුන් වෙයි. ඉදිමීමෙන් ඇතිවන ස්ථූල භාවයට වඩා ස්වභාවයෙන් ම ඇති කෙට්ටුකම ජීවිතයට හිතවත් වන්නාක් මෙන්, ලොවට පෙන්වීමට පමණක් ඇති කැර ගන්නා බොරු ලොකුකම් වලට වඩා තමා තුළ පවත්නා පුංචිකම සතුට ගෙන දෙන බව සලකා හැකි පමණ සත්‍යයට අනුව තම ජීවිතය පවත්වා ගෙන යායුතු ය.

හැම තත්පරයක් ම රන් සේ සැලකිය යුතු ය. නිදා ගැනීමාදියෙන් නිකරුණේ කාලය ගත කිරීම ජීවිතයට මහත් සාපයකි. කාලයේ වටිනාකම ක්‍රියාවෙන් ලබාගත යුතු ය. සිංහයා කැලේ සිටින රජු යැයි කියා සත්තු උගේ කටට නොපනිති. සිංහයා ද අලස නොවී වෙහෙස මහන්සී වී කටයුතු කළහොත් සතුන් අල්ලා ගත හැකි ය. එලෙස ජීවිතයේ සඵලත්වය අපේක්ෂා කරන්නවුන් විසින් ස්ථිර අධිෂ්ඨානයෙන් යුතුව පැහැදිලි ඉලක්කයක් අනුව ඉදිරියට ගමන් කළ යුතු ය. එබැවින් දියුණුව අපේක්ෂා කරන ඔබ දුර්ලභව ලබාගත් මිනිසත් බව අර්ථවත් කැර ගන්නටත් මෙලොව දියුණුව හා පරලොව දියුණුව සලසා ගන්නටත් තරයේ අදිටන් කැර ගත යුතු ය.



# මැලිකම හා පමාව

**මුතු සීයා විසිනි**

දුවේ, පුතේ, ඔබ සැම දෙනා ම නව වසරේ දී දහම් පාසලේත් සාමාන්‍ය පාසලේත් අලුත් පන්තිවලට සමත්ව ඇතැයි මා විශ්වාස කරනවා. ඒ නිසා වසර මුල සිට ම අලුතින් ලැබී ඇති පොත් කියවා ධාරණය කර ගන්නටත්, ඉදිරි කටයුතු සාර්ථක කර ගන්නට අලුත් බලාපොරොත්තු ඇති කර ගෙන ජීවිතය යහපත් කර ගන්නට තුඩු දෙන අලුත් පුරුදු ඇති කර ගන්නටත් අධිෂ්ඨාන කර ගන්නට ඕනෑ.

ඔබ අප වගා කර ගත යුතු යහපත් පුරුද්දක් තමයි කලට වේලාවට කටයුතුවල යෙදීම. එයට මුල පිරීමක් වශයෙන් උදෙන් ම පිබිදෙන්නට පුරුදු විය යුතුයි. උදයෙන් ම පිබිදීම පිළිබඳව අපට හොඳ ආදර්ශයක් දෙන පක්ෂියකු ඉන්නවා. ඌ තමයි කුකුළා. ඌ උදෙන් පිබිදී හඬ ලනවා. ඒ හඬ ලෑම හෝරා යතුරක (ඔරලෝසුවක) අවශ්‍ය වේලාවට නාද වනු වගෙයි. ඒ නිසා තමයි ‘කුකුළා මල්ලේ දා ගෙන ආවා . කුකුළත් එක්ක ම නැගිට්ටා ’ යන යෙදුම් සාමාන්‍ය ජනයා අතර පවතිනුයේ.

උදෙන් පිබිදුණේ නැති නම් දිනය තුළ කළ යුතු කාර්යයන්හි විශාල ප්‍රමාදයක් ආරම්භයේ දී ම සිදු වනවා. ඒ හේතුවෙන් සමහර වැඩ කොටස් අත හරින්නට සිදු වනවා. නැති නම්

කරන වැඩ නියමාකාරයෙන් නිම කිරීමට නොහැකි වනවා. සාමාන්‍ය කතා වහරෙහි උඩින් පල්ලෙන් කරලා දානවා කියන්නේත් ඒ නිසා.

ඔබ බොහෝ දෙනෙකු පාසල් යන සිසු - සිසුවියන් නිසා , උදෙන් පිබිදෙන්නට පමා වුව හොත් එදිනට අවශ්‍ය පොත්පත් හරියට සූදානම් කර ගන්නට - සකස් කර ගන්නට අසමත් වනවා, අමතක වනවා, ඇඳුම් පැළඳුම් හරියට ඇඳ ගන්නට අපහසු වනවා. පාසලට බසයකින් යනවා නම් නියම බසයට නගින්නට අසමත් වනවා. පාසල් දොරටුවේ දී, පමා වීමට හේතු කියන්නට යෑමෙන් තවතවත් පන්තියට යෑම පමා වනවා. ඒ නිසා පන්තියේ පසු පෙළ අසුන් ගන්නටත් සමහර විට සිදු වනවා. පන්තියේ පාඩම්හි නියම අයුරින් යෙදෙන්නටත් අපහසු වනවා. උගන්වන ලද ඇතැම් කොටස් අත හැරෙනවා.

පමාවීම මැළිකමේ ද ලක්ෂණයක්. උදයට අවදි නොවන්නේත් නියම වේලාවට කටයුතුවල නො යෙදෙන්නේත් මේ මැළිකම නිසා මැයි. පන්සිය පනස් ජාතක පොතේ 71 වැනි ජාතකය වන වරණ ජාතකය මේ පමා වීමට නිදසුනක් වශයෙන් ගෙන හැර දක්විය හැකියි. වරණ ජාතකයේ අදාළ කොටස පමණක් දූලා පුතාලා ගේ දැන ගැනීම පිණිස මෙසේ දක්වමි.

අතීතයේ බරණැස් නුවර බඹදත් රජ්ජුරුවන් රජ කරන සමයේ දිසාපාමොක් ආචාරීන් වහන්සේ පන්සියයක් සිසුනට උගන්වමින් සිටියා. ලබන ශිල්පය සඳහා කහවනු නො ගෙවන සිසුන්, ආචාරීන් ගේ අතැවැසි සිසුන් ලෙස, නිවසෙහි කටයුතු කිරිමෙහි යෙදුණා. මේ සිසුන් දිනක් දර කඩා ගෙන එනු පිණිස කැළයට ගියා. ඔවුන් අතර සිටි කම්මැළි සිසුවකු ඒ කැළෑවේ තුබූ ලුණුවරණ ගසක් දැක එය මළ ගසක් ය සිතා පසුව අතු කඩා ගන්නා අදහසින් එතැන තම උතුරු සළුව අතුරා ගෙන

ගොරව ගොරවා නිදා ගත්තා. දර කඩා ගෙන ආපසු යන අනෙක් සිසුවන් ඔහුට පයින් ඇන අවදි කර යන්නට ගියා. ඔහු කලබලෙන් නිදිමතින් ම පිබිදී ලුණුවරණ ගසට නැග දර කඩද්දී ඇස් ද තුවාල කර ගත්තා. ඔහු ඒ අමු දර කඩා ගෙන මිටියක් බැඳ ගෙන ගොස් අනෙක් දර ගොඩට ම දැම්මා.

පසු දින උදයේ ඈත පිටිසර ගමක දානයකට යෑමට සූදානම් වූ ආචාරීන් වහන්සේ නිරාහාරව එහි යෑමට අපහසු නිසා, සිසුවන් අමතා කැඳ පිස බී යෑම සඳහා කැඳ පිළියෙළ කරවා ගන්නට දාසියනට දන්වන ලෙස කීහ. ඒ අනුව දාසියට දන්වන ලද මුත් දරමිටි ගොඩේ උඩින් ම අමු දර තබා තිබූ නිසා ගමන අරඹන වේලාව වන තෙක් ම කැඳ පිස ගන්නට ඕ අසමත් වූවා. මේ ගැන සියලු තොරතුරු සිසුහු ආචාරීන් වහන්සේට දැන්වූවා.

ගමන යෑම අත හැරුණෙන් දිසාපාමොක් ආචාරීන් වහන්සේ මෙසේ පැවසූහ. ''යම්කිසි මෝඩ කම්මැළි කෙනෙක් පළමුවෙන් කළ යුතු දෙය මේ ය, පසුව කළ යුතු දේ මේ යැයි පරීක්ෂා නොකොට කටයුතු කරත් ද එවැන්නෝ මේ කම්මැළි සිසුවා මෙන් පසුතැවිල්ලට පත් වෙත්. මේ අතීත කතාව බුදුන් වහන්සේ දේශනා කළේ බුදුන් දවස පසුබට වීර්යයෙන් යුතු වූ නිසා අනෙකුත් තෙරුන් වහන්සේලා සමඟ කමටහන් වැඩීමට නොගොස් අවසන් රැයේ දී නිදි වරාගෙන මහත් වෑයමින් මහණදම් පුරද්දී, වැටී ඉළ ඇටය කඩා ගත් කුටුම්බිය තිස්ස තෙරුන් උදෙසා ය.

ඒ නිසා දරුවනේ, වසර ආරම්භයේ සිට ම මැළි නොවී, ක්‍රමානුකූල ව, ඉගෙනීමේ කටයුතුවලත් වගකීම්වලත් දහම් පිළිවෙත්හිත් යෙදෙමින් ජීවිතය සරු කර ගන්නට උදා වූ මේ නව වසරෙහි දී උත්සාහවත් වන්න.



# සෝණනන්ද ජාතකය


කොළඹ විශාඛා විද්‍යාලයයේ විශ්‍රාමලත් ආචාර්යාණි
**ලක්ෂ්මී පෙරේරා මහාත්මනිය විසිනි**


මහ පොළොව සේ නිසල ගුණ ඇති අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන කල සෝණනන්ද ජාතකය දෙසූ සේක. ඒ ගිහිගෙය හැරදා මහණදම් පුරමින් තම දෙමාපියනට උපස්ථාන කළ එක් භික්ෂූන් වහන්සේ නමක් වෙනුවෙනි. එවැනි නුවණැත්තන් තම දෙමාපියන් කිසි කලෙක අමතක නොකරන බැව් බුදුරජාණන් වහන්සේ වදාළහ. ඈත අතීතයේ පවා මෙවැනි උතුමන් සිටි බැව් වදාළ බුදුරජාණන් වහන්සේ මෙම ජාතකය දේශනා කළ සේක.

යටගිය දවස බ්‍රහ්මවර්ධන නම් නුවරක් විය. දඹදිව පිහිටි මේ නුවර රාජ්‍ය පාලකයා වූයේ මනෝජ රජතුමා ය. මෙකල විශාල ධනස්කන්ධයක් හිමි බමුණුකුල කාන්තාවකට පුත්තු දෙදෙනෙක් වූහ. සෝණක හා නන්ද ඒ පුත්තු දෙදෙනායි. දෙදෙනාම මෙම මහා මුදල් සම්භාරය පරිහරණය කිරීමටත්, සැපවත් ගිහි ජීවිත ගතකිරීමටත් අකමැති වූහ. පුත්තු දෙදෙනාගේ අදහස අනුමත කළ දෙමාපියෝ ද ගිහි ජීවිතය අත හැරීමට ඉටා ගත්හ. මව්පිය දෙපළ ද, සෝණක හා නන්ද පුත්තු දෙදෙනා ද ගේ දොර අතහැර හිමාල වනයට ගොස්, පැවිදි වී, අසපුවක් තනා එහි වාසය කළහ.

බාල පුතු නන්ද තාපසයෝ සෑම දින ම සෝණ තාපසයනට

පෙර පල වැල නෙළා ගෙනැවිත්, මවුපිය දෙදෙනා පෝෂ්‍ය කළහ. සෝණ තාපසයෝ තම සොයුරු නන්ද තාපසයනට තමා හට ද දෙමාපියන්ට උපස්ථාන කිරීමට අවස්ථාවක් දෙන ලෙස ඉල්ලා අවවාද කළ මුත් ඉන් පලක් නොවී ය. සෝණ තාපසයනට තම දෙමාපියනට සැළකීමට අවස්ථාවක් නොලැබුණු හෙයින් තමන්ට ඇහුම්කම් නොදුන් නන්ද තවුසා පළවා හැරියේ ය.

නැවත බ්‍රහ්මවර්ධන පුරය කරා ගිය නන්ද තාපසයෝ මනෝජ රජතුමාගේ උපදේශකයකු ලෙස සේවය කිරීමට පටන් ගත්හ. මනෝජ රජතුමා ද නන්ද තාපසයන් කෙරෙහි පැහැදුණි. අවසානයේ මුළු දඹදිව සියලු රාජ්‍යයන් තම යටතට ගැනීමට රජතුමාට හැකිවුණි. නන්ද තාපසයෝ තම ප්‍රශ්නය රජු සමඟ පවසා දෙමාපියන් බැලීමට යෑමට අවසර ඉල්ලූහ. මනෝජ රජු හා පිරිවර සමඟ නන්ද තාපසයෝ ද දෙමාපියන් ඉන්නා අසපුවට පැමිණියහ. තමා කළ වරදට නන්ද තාපසයෝ තම වැඩිමහල් සොයුරු සෝණ තාපසයන් ගෙන් සමාව ඉල්ලූහ.

සෝණ තාපසයෝ තම සොයුරු නන්ද තාපසයන්හට සමාව දී මව්පියනට උපස්ථාන කිරීමේ ආනිසංස දක්වමින් දහම් දෙසූහ. ඒ දහම් දෙසුමට සවන් දුන් මනෝජ රජතුමා දැහැමි ලෙස රාජ්‍යය පාලනය කර මරණින් පසු දෙව්ලොව ඉපදුණි. සෝණ හා නන්ද තාපස සොයුරෝ මරණින් පසු බ්‍රහ්ම ලෝකයේ උපන්නාහ.

එකල සෝණ තාපසයෝ අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ ය. නන්ද තාපසයෝ ආනන්ද තෙරණුවෝ ය. මනෝජ රජතුමා සැරියුත් මහ රහතන් වහන්සේ ය. දෙමව්පිය දෙපළ සුද්ධෝධන රජතුමා හා මහාමායා දේවියයි.

මාපියනට උපස්ථාන කරන්නා වූ දරුවනට දෙමාපියන්ගෙන් අනුකම්පාව ආදරය නොමඳව ලැබේ. බුදුරජාණන් වහන්සේ මහානාම ශාක්‍යතුමාට වදාළේ,

**''මාපියන් විසින් අනුකම්පා කරන ලද කුල පුත්‍රයා දියුණුවෙන් දියුණුවට පත් වන්නේ ය. පිරිහීමක් නොවන්නේ ය''** යනුවෙනි.

සිරිත් මුතුහර හෙවත් ගුණ මිණි ආර - 07



# එක ම දැයක් ලෙස සිතීම

**'ගුරු සීයා' විසිනි**

"දකුණ නැගෙනහිර බටහිර උතුර ද
එක කොඩියේ සෙවණේ
එක ම දයක් වී මහ බලයක් වී
පෙරට මැ යමු ලංකා "

කුඩා කල සිට අප බොහෝ දෙනකුට අසා පළ පුරුදු ප්‍රකට ජාතිකානුරාගී ගීයෙක මුල් ගී කොටස යි ඉහතින් දක්වන ලද්දේ. අරීසෙන් අහුබුදු සූරීන් ලියා ඇති එම ගීය අදටත් ඉතා කමනීය ව ඇසිය හැකි ය.

අපේ පැරැණි සිංහලයෝ තමන් උපන් ජාතියට අදහන ආගමට කතා කරන බසට ජන්ම භූමියට වැඩ කිරීම, ඒවායේ දියුණුව වෙනුවෙන් ක්‍රියා කිරීම තමන් ගේ පරම යුතුකම ලෙස සැලකූහ. තමා ගේ ජාතිය ගැන සිතන තැනැත්තාට ජාතිවාදියෙකැ යි හෙවත් ජාතිය ගැන උමතුවෙන් සිතන කෙනෙකැ යි කවුරුවත් නො කීහ. සිය ජාතියේ දියුණුව ගැන සිතන තැනැත්තා තම ජාතියේ එකමුතුකම සමඟිය වෙනුවෙන් නිරන්තරයෙන් වෙහෙසෙයි. ජාතිහිතෛෂී ඒ පුද්ගලයා අනෙක් ජාතියකට, අනෙක් ජාතියක දියුණුවට විරුද්ධ ව ක්‍රියා නො කරයි. ජාතියක නැගී සිටීම ඇති වන්නේ ජාතික සමඟියෙන් ම බව හෙතෙමේ නුවණින් සිතයි.

මේ වසරේ උපත් සියවස සමරනු ලබන අග්ගමහාපණ්ඩිත අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක මා හිමිපාණෝ දිගු කලක් තිස්සේ සිංහලයාට දැඩි ලෙස අවධාරණය කෙළේ ''සිංහලයෙනි, සමඟි වන්න, සමඟි වන්න, සිංහල සමඟිය ජාතික සමගියේ පදනම යන බවයි. ඒ සමගිය ''සිංහල දෙමළ මුස්ලිම් ජාතික සමඟියේ ද පදනම වන'' බව උන් වහන්සේ අවධාරණය කළහ.

අප ගේ ම දය පළාත්, කුල, ආගම්, පක්ෂ, ආදි පවුරුවලින් බෙදී වෙන් වී ක්‍රියා කිරීම නිසා ජාතියට සිදු වී ඇති පරිහානියේ තරම අපේ කුඩා දරුවන් ගේ ළපැටි මොළවලට වුවත් වැටහී යා යුතු ය. එදා සිංහලයෝ ජාතියේ අනාගත පැවැත්ම ද සිතා දූරදර්ශීව ක්‍රියා කළහ. දුටුගැමුණු, මහ පැරැකුම්බා වැනි මහ නරවිරුවෝ ද හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි, අනගාරික ධර්මපාල, වලිසිංහ හරිශ්චන්ද්‍ර, කුමාරතුංග මුනිදාස, ඩී.ඇස්. සේනානායක වැනි ජාතික වීරවරයෝ ද ඔවුන් ගේ යුතුකම් නො පිරිහෙළා ඉටු කෙළේ ජාතියේ අනාගතාරක්‍ෂාව ද අධිෂ්ඨාන කැරගෙන ය.

මේ රටේ අන්‍ය ජාතීන් ගේ ගැටලු ප්‍රශ්න කථා කරන්නට ඒ ජාතීන් තුළ ජාතික නායකයන් ඕනෑ තරම් සිටිතත් සිංහල ජාතියේ ප්‍රශ්න හා අසාධාරණකම් ගැන කථා කරන්නට කිසිදු දේශපාලකයෙක් නැත. තාවකාලික බලය ගැන සිතන ඔවුහු එය රැකගැනීමට පමණක් නිතර කල්පනා කරති. සිංහල ජාතිය හා භූමිය රැකගැනීමට ජාතියට අවශ්‍ය නායකයන් අපේ ළමා පරපුර අතරින් බිහි විය යුතු ය. සිංහල ජාතිය අසරණ ජාතියක් නොවේ. ශ්‍රී සුමංගල නාහිමිවරු, එස්. මහින්ද හිමිවරු, ධර්මපාලවරු අපේ ජාතියට දැන් අවශ්‍යය ය. සිංහල ලේ ඇති දරුවෝ, සිංහල කම ඇති තරුණයෝ පෙරමුණට එත් වා !

විදේශීය අධ්‍යාපනය ලැබූ, විජාතික ගැතිකම් ඇති, කඳ සිංහල වුවත් මනසින් පරගැතිකම්වලට ආ වඩන අය අප අතර වෙති. සිංහලකමට, සිංහල ජාතියට හිතෛෂී ව කථා කිරීම, ක්‍රියා කිරීම ජාතිවාදය යැයි ඔවුහු කියති. මේ මතවාදය හීන් සිරුවේ

පැතිරවීම ජාතික පරිහානියේ එක් පැති කඩකි. එහෙත් මුස්ලිම් ජාතිකත්වය ගැන, දෙමළ ජාතිකත්වය ගැන කතා කරන කිසිවකුට වත් 'ජාතිවාදී ' හංවඩුව ගසන ජාති භ්‍රෂ්ටයෝ ඔවුන් අතර නැත. ඔවුන් ලබන විජයග්‍රහණවල රහස එයයි.

වෙළෙඳ භාණ්ඩවලට ''හලාල්'' ලකුණ යෙදීම ගැන විශාල විරෝධතාවක් දැන් පැන නැඟී ඇත. මුලින් ම ''හලාල්'' ආවේ මාංසාහාරය සම්බන්ධයෙනි. දැන් වතුර බෝතලයට, බිස්කට් ආදි වෙළෙඳ භාණ්ඩ හාරදහස් ගණනකට එම ලකුණ යොදා ඇත්තේ මුස්ලිම් වෙළෙඳ ආධිපත්‍ය පැතිරවීමට ය. එය සිංහලයන් සතු ඉඩ කඩම්, දේපළ අල්ලාගැනීමට යොදා ගෙන ඇති කූට උපාය මාර්ගයකි. සිංහලයන් ජාතියට උදා වී ඇති මෙබඳු අනතුරු ගැන දැන්වත් විමසිලි විය යුතු ය. මෙබඳු ව්‍යාපාර ජාතීන් අතර සමඟියට ද බලවත් ලෙස හානියක් කරයි. අපේ වීර සිංහල දරුවෝ 'හලාල්' ලකුණ යෙදු භාණ්ඩ වර්ජනය කිරීමට දෙමවුපියනට වැඩිහිටියනට බල කරත්වා ! විජාතික සුහද ආක්‍රමණිකයන් ගෙන් අපේ රටත් සිංහල ජාතියත් බේරා ගනිත්වා !

පඬු අබා නුවණ, දුටුගැමුණු එඩිය, මහ පැරැකුම් සවිය, රාජසිංහ බලය, සිරි රහල් කිවියාට, කුමරතුඟු පඬියාව, ධර්මපාල දර්ශනය, නැවතත් අපේ ළමා විරුවන් තුළ පණ ලබා වා ! අපේ රටත්, දැයත් බසත් සසුනත් එයින් ම ප්‍රාණවත් ව පිබිදේ වා ! අන්‍ය ජාතියකට අසාධාරණ ලෙස එරෙහිව නො නැඟෙන ඒ සැබෑ ජාත්‍යාලය ඒ සැබෑ දේශප්‍රේමය අපේ දරුවන් තුළින් ජීවය ලබා වා ! සකල ශ්‍රී ලාංකික සිංහලයන්ගේ ම ප්‍රාර්ථනය එය යි.

එස්. මහින්ද හාමුදුරුවන් ගේ පහත සඳහන් කවිය නුවණින් අවධාරණය කරත් වා !

මගේ රට මාගේ ජාතිය    මගේ ගම
මගේ සත් සිරින් සහ ජාතික    උරුම
මගේ වැරයෙන් ම නිදහස් කොට    තැබුම
මගේ යුතුකමැයි සළකවු හැම    දෙනම !



# දස මහා යෝධයෝ

සිරි වජිරාරාම දහම් පාසලේ ආදි ශිෂ්‍යා
**සඳුලි ජයවර්ධන මහාත්මනිය විසිනි.**

ලංකාවේ ස්වර්ණමය යුගය වශයෙන් සැලකෙන දුටුගැමුණු රජ සමය ශ්‍රී ලංකාවට ජාතික, ආගමික සහ ආර්ථික වශයෙන් ඉතාමත් දියුණුවට පත්වූ යුගයක් බව ඉතිහාසය දෙස බැලීමේදී පෙනී යයි. දුටුගැමුණු මහරජතුමා හට එම කාර්යය සාර්ථක කරගැනීමට අවශ්‍ය පරිසරය සකසා දුන්නේ කාවන්තිස්ස මහරජතුමායි. එතුමන් දස මහා යෝධයන් පුහුණු කරවා අවශ්‍ය කාලයේදී තම පුතුට ඔවුන්ගේ සේවය ලබා දුන්නා.

දුවේ, පුතේ අපේ ඉතිහාසයේ වීර සිංහල නාමාවලියට ඇතුළත් වන මේ දස මහා යෝධයන් සිංහල ජාතිය සහ බුද්ධ ශාසනය රැකගැනීමට කළ මෙහෙය අපමණයි. ඔවුන් හට කරන ගෞරවයක් ලෙස අප ඔවුන් ගැන ඉගෙනීමටත් නිතර එතුමන්ලා සිහිපත් කිරීමටත් අමතක නොකළ යුතු ය. සිංහල ජාතියට ආඩම්බර විය හැකි දසමහා යෝධයන් පිළිබඳ, ඔවුන් ගේ උපන් ගම් හා විසූ ස්ථාන තවදුරටත් ඉතිහාසයෙන් වැළලී යාමට ඉඩ නොදීම අපගේ යුතුකමකි.

## 01. මහා සෙන්පති නන්දිමිත්‍ර යෝධයා

දුටුගැමුණු රජතුමාගේ මහාසේනාපති වශයෙන් ක්‍රියා කළ නන්දිමිත්‍ර එළාර රජතුමාගේ මිත්‍ර නම් සෙනවියකුගේ

නැගණියකගේ පුතෙකු බව මහාවංශය සඳහන් කරයි. මෙතුමා නැගෙනහිර පළාතේ කඩරොද නම් කර්මාන්ත ගමේ උපන් බව සඳහන් ය. වත්මන් වවුනියාවේ සිට සැතැපුම් හයක් පමණ ගිය තැන පිහිටි මහාකච්චකොඩි යනුවෙන් හැඳින්වෙන්නේ ද මේ ගම බව විශ්වාස කෙරේ. අනුරාධපුරය, වයඹ පළාත සහ රුහුණෙන් ද ඔහුගේ සෙල්ලිපි හමු වී ඇත. නන්දිමිත්‍ර යෝධයා දුටුගැමුණු මහරජතුමා ළඟට අණදෙන සේනාධිනායකයා හැටියට කටයුතු කළේ ය.

## 02. සුරනිමල යෝධයා

දසමහා යෝධයන්ගෙන් ශ්‍රේෂ්ඨයකු වන සුරනිමල කඩු හරඹයෙහි අති දක්ෂයෙකි. ඔහු කොට්ටිවාල නම් ජනපදයේ කණ්ඩකවිට්ටි නම් ග්‍රාමයේ සංඝ නැමැති කෙළඹියාගේ සත්වන පුත්‍රයා ය. එදා කණ්ඩකවිට්ටි නමින් හැඳින්වූ ග්‍රාමය මහවැලි ගඟ බඩට අයත් පොලොන්නරු ප්‍රදේශයේ වත්මන්හි මනම්පිටිය බව කියවේ.

## 03. ගෝඨයිම්බර යෝධයා

ගෝඨයිම්බර යෝධයා රුහුණු රට ගිරවා පත්තුවේ නිටුල්පිටි ගමේ උපන් බව ප්‍රකට ය. මාතර තිස්ස මහ මාවතේ තංගල්ලේ සිට සැතැපුම් 3ක් ගිය විට නිටුල්පිටිය හමුවේ. ගෝඨයිම්බරගේ පරපුර මහානාග පරපුරයි. කුඩාකල අභය නමින් නම් තබන ලදුව පසුව ඉඟුරු වනයක් කපා කුඹුරක් සකස් කිරීම නිසා ගෝඨයිම්බර යැයි ව්‍යවහාර විය. මිටි නිසා ගෝඨ යැයි හැඳින්විණි. වර්තමානයේ ගෝඨයිම්බර යෝධයාගෙන් පැවත එන පරපුර මහානාග යනුවෙන් හැඳින්වේ. එම පරපුර තවමත් නෙටොල්පිටිය සහ රුහුණේ ශ්‍රේෂ්ඨ පරපුරක් ලෙස ප්‍රසිද්ධියට පත් වී ඇත. විජිතපුර සටනේ දී කඩොල් ඇතු මෙහෙයවූයේ මොහු බව සඳහන් වේ.

## 04. වේළුසුමන යෝධයා

වේළුසුමන යෝධයා දුටුගැමුණු රජතුමා ගේ අශ්ව හමුදාවේ නායක තනතුර දැරී ය. මොහු රුහුණේ ගිරි ජනපදයේ කුටුම්බියංගන නම් ගමේ කුටුම්බි වසභ නම් කෙළඹියාගේ පුත්‍රයා බව සඳහන් ය. වසභ ගේ ඉතා කුළුපග ම යහළුවන් දෙදෙනකු වන වේළු සහ සුමන යන දෙදෙනා කුඩා ළදරුවා බැලීමට පැමිණි අවස්ථාවේ දී වසභ විසින් යහළුවන් දෙදෙනාගේ නම් එක් කොට වේළුසුමන යන නම තබන ලදි. වත්මන් ගිරුවා පත්තුවේ ප්‍රසිද්ධ ගමක් වන සිටිනාමළුව එදා කුටිම්බියංගන ලෙස හඳුන්වා ඇත. සිටිනාමළුව, බෙලිඅත්ත සහ තංගල්ල අතර පිහිටි ප්‍රසිද්ධ ගමකි. ශූර අසරුවකු වූ වේළුසුමන යෝධයා අසකු පිට නැගී කවාකාර මගෙක යනවිට අසුන් සමූහයෙකින් යුත් වළල්ලක් සේ පෙනෙන අයුරින් අසු මෙහෙයැවීමෙහි සමතෙක් වී ය.

## 05. ඛංජදේව යෝධයා

මුල දී දේව නමින් නම්තැබූ මුත් මඳක් කොර ගසා යන හෙයින් ඛංජදේව නමින් ප්‍රසිද්ධ විය. මඳක් කොරගැසුව ද කැලෑවේ මුවන් ලුහුබැඳ උන්ගේ පා වලින් අල්ල ගැනීමට තරම් ජව වේගයක් ඔහුට තිබුණේ ය. ඛංජදේව නකුල් ගල් කර්ණිකායෙහි මහේන්ද්‍ර දෝණි නම් ගම අභය නැමැත්තාගේ බාල පුත්‍රයා බව ප්‍රකට ය. නකුල්ගල කර්ණිකා හෙවත් නකුල් නගරය වැල්ලවායේ සිට සැතැපුම් අටක් පමණ ඈතින් පිහිටි වර්තමාන මිද්දෙණිය බව සඳහන් වෙයි.

## 06. ඵුස්සදේව යෝධයා

ඵුස්සදේව යෝධයා සක් පිඹීමෙහි මෙන් ම හී විදුමෙහි ද දක්ෂයෙකි. දුටුගැමුණු රජතුමා කලත්වැව මහ යුද්ධයෙන් අනුරාධපුරය ජයගත් විට සක පිඹීමෙන් ඒ ජයග්‍රහණය ප්‍රකාශ කෙළේ ඵුස්සදේව යෝධයා විසිනි. රුහුණු රට සිතුල්පවු විහාරය සමීපයේ කපිය නම් ගම උත්තල නම් තැනැත්තාගේ

පුත්‍රයා මොහු ය. ඵුස නැකතින් උපන් නිසා ඵුස්සදේව යන නම තැබිණි. මොහු උපන්ගම මාළිගාවිල නැමැති ප්‍රදේශයයි. දුටුගැමුණු රජතුමා රට එක්සේසත් කළ පසු ඵුස්සදේව මහණ විය. උන්වහන්සේ පල්ලේබැද්ද සංඛපාල විහාරයේ වැඩ විසූ බව ද පළවේ.

## 07. ලභියවසභ යෝධයා

ලභියවසභ යෝධයා බර ඉසිලීමේ සහ කඩු හරඹයෙහි අති දක්‍ෂයෙකි. යුද්ධයෙහි දී මෙන් ම රට සංවර්ධනයෙහි ද වැව් බැඳීමට ද උපකාර විය. කාය ශක්තියෙන් අනූන වූ හේ වැවක් බඳින අවස්ථාවේ දොළොස් දෙනෙකු වත් ඉසිලිය නොහැකි වූ බර ඉසිලු බව සඳහන් වේ. තුලාධාර පර්වත සමීපයෙහි විහාර වැව නම් ගමේ මත්ත නම් කෙළඹියාගේ පුත් වූ මොහුට කුඩා කල වසභ නම් තැබූ අතර රූප ශෝභාවෙන් සම්පූර්ණ වූ නිසා ලභියවසභ නමින් හැඳින්විණි. වත්මන් නිමලව ආරණ්‍ය සේනාසනය නමින් ප්‍රසිද්ධ පූජනීය ස්ථානය පිහිටි ප්‍රදේශය ඔහුගේ ගම බව සඳහන් වේ.

## 08. මහාසෝණ යෝධයා

ඇතකුට සමාන කාය - බාහු බලැති අයෙකු බව සඳහන් වේ. ඔහු රුහුණු රට සුන්දරවාපි නම් ගමේ තිස්ස කෙළඹියාගේ නවවැනි පුත්‍රයා විය. සත් හැවිරිදි වියේ පටන් කළ විස්කම් දස්කම් නිසා මහාසෝණ නමින් හැඳින්විණ. ඔහු උපන් ගම අතීතයේ ඌව පළාතට අයත් එකකි. එය වත්මන පොතුවිල් ආසනයට අයත් එකකි. පුරාණයේ කළු ගඟේ සිට මහවැලි තෙක් රුහුණු රටට අයත් වූ නිසා මහාසෝණ ගේ උපන් ගම පොතුවිල් අසල විය යුතු ය. අද මෙම ගම වනගත පෙදෙසක් විය හැකි ය.

## 09. භරණ යෝධයා

භරණ යෝධයා ශක්තිමතකු වූ අතර ගොවි ජීවිතය ප්‍රිය කළ බව පැවසේ. මොහු රුහුණු රට කප් කඳුරු නම් ගමේ

කුමාර නම් කෙළඹියාගේ පුත්‍රයා ය. මේ කුමරු මව් කුසින් උපන් නිධානයක් පහළ වූ හෙයින් සතුටට පත් මව්පියෝ ඔහුට භරණ යන නම තැබූහ. කුඩා කල සිට ම මහත් සේ දස්කම් දක්වූ භරණ දුටුගැමුණු රජතුමාගේ යුධ හමුදාවේ ප්‍රධාන සේනාපතියෙකු ලෙස කටයුතු කළේ ය. භරණ යෝධයාගේ උපන්ගම වන කප් කඳුරුගම කතරගම බව හිටපු පුරාවිද්‍යා අධිකාරි මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ මතයකි.

## 10. ථේරපුත්තාභය යෝධයා

රුහුණු රට කැනිගම රෝහණ නම් සිටාණන්ගේ පුත්‍රයා වන මොහු ගෝඨාභය නමින් හැඳින්විය. ඔහුට ඇතුන් දස දෙනෙකු ගේ බල ශක්තිය තිබූ බව පැවසේ. මෙතුමාගේ පියා සුමන නම් තෙරුන් වහන්සේගෙන් බණ අසා පුතා සමග ම මහණව භාවනායෝගීව රහත් බවට පත්විය. අභය සාමණේරයෝ ඉන්පසුව ථේරපුත්තාභය නමින් හැඳින්වුණහ. එතුමන් සප් පඳුරු නම් ගම විහාරයේ වැඩ විසූ බව දක්වේ. මෙම විහාරය වර්තමානයේ අම්බලන්තොට වලවේ ගඟ අසබඩ වඳුරු රුප්ප නමින් හැඳින්වෙන විහාරය බව පොත පතේ සඳහන් වේ. ථේරපුත්තාභය යෝධයාගේ උපන් ගම කතරගම බව පුරා විද්‍යාඥ සී. ඩබ්. නිකලස් මහතාගේ මතයයි.

**(දස මහා යෝධයෝ - පූජ්‍යපාද ආචාර්ය කඹුරුපිටියේ වනරතන මහානායක ස්වාමීන් වහන්සේ විසින් ලියන ලද ලිපියක් ඇසුරෙනි.)**



# අපේ ම වූ චින්තනයකින් නැගී සිටිමු

**ශාස්ත්‍රපති පූජ්‍ය නාඔටුන්නේ නන්දරතන හිමිපාණන් විසිනි.**

ආදර්ශ සපයා ගැනීම සඳහා ද මඟ පෙන්වීම උදෙසා ද නායකත්වය යන්න අතීතයේ සිට ම අපගේ ජීවිත සඳහා විශාල බලපෑමක් කරනු ලබන්නකි. රටේ ජාතියේ හා ආගම දහමෙහි ද පමණක් නොව උදාර වූ සිරිත් විරිත් හා සංස්කෘතික දායාදයන් මතු පරපුර උදෙසා පවත්වාගෙන යෑම සඳහා ද නායකත්වයෙන් ලැබෙන්නේ මහඟු පිටිවහලකි. නව ලොවට පියමං කිරීමට ද ඉන් සුවිශාල ආලෝකයක් ලැබේ.

බුදුරජාණන් වහන්සේ ද නායකත්වය හැමවිටම අගය කොට සළකා ඇති බවට ත්‍රිපිටකයෙහි අන්තර්ගත තොරතුරුවලින් හෙළි වේ. ඒ ඒ පුද්ගලයා සතු සුවිශේෂී ගති ලක්ෂණ හඳුනාගත් බුදුරදුන් ඔවුනට ප්‍රමුඛත්වය දීමට ක්‍රියා කළහ. එහෙත් සමකාලීන භාරතීය සමාජයේ පුද්ගල නායකත්වය අන් සියල්ලට ම වඩා ප්‍රධාන කොට සලකනු ලැබී ය. ආගමික බලපෑම් සමාජයට යොමු කිරීම සඳහා ශාස්තෘත්වය එක ම හා අසහාය නායකත්වයක පැවති පෙනේ. දේව නිර්මාණවාදී ආගමික ප්‍රවණතාවන්හිදී ''සත්‍යය ද මාර්ගය ද ජීවනය ද මම වෙමි'' යි පවසා පුද්ගල නායකත්වයක් පුද්ගල බද්ධව අවධාරණය කරන ලද ආගමික ඉගැන්වීම් බහුල විය.

දේව නිර්මාණවාදයත් සමඟම ''සර්වව්‍යාපී'', සර්ව බලධාරී , සර්වතෝභද්‍ර'' සදාකාලික ප්‍රධානත්වයක් හුවා දක්වන ලදී.

එහෙත් බුදුරදුන් මීට හාත්පසින් ම ප්‍රතිවිරුද්ධ වූ, ඉගැන්වීමක් ලොවට හෙළිකර තිබේ. උන්වහන්සේ ගේ සුවිශේෂ, ඇගයීම වූයේ පුද්ගල නායකත්වය නොව ප්‍රතිපත්තිමය වූ නායකත්වයයි.

ශාස්තෘවරයෙකු වශයෙන් බුදුරජාණන් වහන්සේ හැමවිට ම ධර්මය නායකත්වයෙහි ලා සළකන ලද අතර සිය ශ්‍රාවකයන්ට ද ඒ සඳහා මඟ පෙන්වන ලදී.

''යෝ ධම්මං පස්සති සෝ මං පස්සති'' පෞද්ගලිකත්වයෙන් මුදා ප්‍රතිපත්තියට ප්‍රමුඛත්වය දීමට උත්සුක වූහ. ධර්මයට නැඹුරු ඒ ඒ පුද්ගලයා සතු හැකියාවට කුසලතාවට හා ස්වීයත්වයට මුල් තැන දුන් බුදුරදුන් විසින් අවධාරණය කරන ලද්දේ ඒ කෙරෙහි විශ්වාසය තබා නැගී සිටීම පිණිස ය. බුදුරදුන් විසින් ශාස්තෘත්වයේ නායකත්වයද හිමිකර දෙන ලද්දේ ධර්මයට හා විනයට ය. එසේ විනා තමන් වහන්සේ ගේ පුද්ගල කායට නොවේ.

''මයා ධම්මො ච විනයො ච දේසිතෝ, සෝ මමච්චයෙන සත්ථා'' යන්නෙන් ඒ බව තහවුරු වන්නේ ය. ශාස්තෘත්වය මඟ පෙන්වන්නෙකුගේ කාර්ය භාරයක් ලෙස දක්වා ඇත. බුදුරදුන් ලොවට දක්වන්නේ තමන් වහන්සේ මග්ගක්ඛායි නම් වූ මඟ කියාදන්නෙකු පමණක් බව ය.

සියවස් 25කට අධික කාලයක් මුළුල්ලේ ලබන ලද අභාසය ඇසුරින් වත්මන් ලාංකික සමාජයට ප්‍රතිපත්තිමය වූ නායකත්වයක සියලු අංශයන්ගෙන් අත්‍යවශ්‍යව තිබෙන බව ඉතා පැහැදිලිව පෙනේ. අද අප රටේ අධ්‍යාපන, දේශපාලන, ආගමික, ආර්ථික හා සමාජීය දියුණුව ඇති කිරීම උදෙසා ඉතා

ප්‍රබලව ප්‍රතිපත්තිමය වූ වැඩපිළිවෙලක වුවමනාව බහුලව දැනෙන්නට වී තිබේ. මෙය ජාතික අවශ්‍යතාවක් ය. රට පුරා පැනනගින බොහෝ ගැටලු අද සාකච්ඡාවට ලක්වන අතර ඒ සෑම ක්ෂේත්‍රයකින් ම මතුවී පෙනෙන පොදු අවශ්‍යතාව නම් ජාතික ප්‍රතිපත්තියක් අත්‍යවශ්‍ය වන බව ය. එවැනි ප්‍රතිපත්තිමය වැඩ පිළිවෙළකින් විනා ගැටලුවලට ස්ථිරසාර විසඳුම් ලබා ගත නොහැකි වන බව ඉතා පැහැදිලිව පෙනේ.

මේ සඳහා බෞද්ධ ආදර්ශය යළි ඉස්මතු කරගැනීම කාලීන අවශ්‍යතාවක් වන බව අවධාරණය කළ හැකි ය. පුද්ගල හා සමාජ ගැටලු නිරාකරණය කරගැනීම සඳහා අපිට උරුමව ඇති චින්තනය එයයි. මතුපිටින් පෙනෙන දකින තත්වයන් යථාර්ථය වශයෙන් හැඳින ගැටලුවලට විසඳුම් ලබා ගැනීමට හැකි නොවේ. ඒ සඳහා මනා විශ්ලේෂණයක් අවශ්‍යව තිබේ. හේතුව සොයා හේතුවට පිළියම් යොදන තුරු නිවැරදිව විසඳුමක් මොනම ගැටලුවකට වුවද සොයා ගත නොහැකි ය. බෞද්ධ චින්තනය අප වෙත ගෙන එන ආදර්ශය එයයි.

විශේෂයෙන් ලංකාවේ ජන සමාජය සඳහා බෞද්ධ චින්තනයක අවශ්‍යතාව අද අත්‍යවශ්‍යව තිබේ. සෑම ක්ෂේත්‍රයක ම පොදු මතය බවට පත්වනුයේ අපටම අනන්‍ය වූ අපේම වූ සංස්කෘතික උරුමය පදනම් කරගත් ආර්ථික, සාමාජික, දේශපාලනික හා අධ්‍යාපනික පදනමක් මත ගැටලු විසඳාගත යුතුව ඇති බවයි. එය ආගන්තුක වූ උරුමයක් නොව බෞද්ධාගම මත සංවිධානය වී වසර දහස් ගණනක් මෙරට ස්ථාපිතව තිබූ උරුමය යළි ඉස්මතු කරගැනීමකි. බුදුරදුන්ගේ පණිවිඩය දේවානම්පියතිස්ස රාජ සමයේ මිහිඳු මාහිමියන් මෙරටට උරුම කර දීමත් සමඟ ආරම්භ වූ ලාංකික ප්‍රබෝධය මෙරට යටත් විජිතයක් වීම දක්වාම ඉතා උසස් තත්වයකින් පැවතියේ ය. තෘප්තිමත් සමෘද්ධිමත් හා සහජීවනයෙන් යුතු ජන සමාජයක් මෙරටට උරුම කර දීමට ඉන් ලැබුණේ අනගි

ආදර්ශයකි. ස්ව ශක්තිය කෙරෙහි විශ්වාසය තබා මෙරටට ම ආවේණික වූ භූගෝලීය හා පාරිසරික වටපිටාවට අනුකූල වූ තත්වයන් යටතේ මෙරට සමාජය සංවිධානය වී තිබුණි. ආගම, ආර්ථිකය, දේශපාලනය, අධ්‍යාපනය සහ පරිසරය වෙන් වෙන්ව හුදෙකලාව පැවතියා නොව සියල්ල අතර පැවතියේ ඒකාත්මික සබැඳියාවකි. අන්‍යෝන්‍ය වශයෙන් මේ සියල්ල සමාන්තරව විකාශනය වූයේ ය. සදාචාරාත්මක සංවර්ධනය හා ආර්ථික සමෘද්ධිය ජනිත වූයේ ද එහි ප්‍රතිඵලයක් වශයෙනි.

යටත් විජිතයක් වීමත් සමඟ ඒ සියල්ල ක්‍රමයෙන් උඩු යටිකුරු වූයේ ය. නිදහසින් පසුව අද දක්වාම අත් විඳින්නට සිදුවී ඇත්තේ එහි අනිටු ප්‍රතිඵලයන් ය. ජාතික චින්තනයක අවශ්‍යතාව වඩාත් අද දවසේ උදා කරගන්නට සිදුවී ඇත්තේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. එවැන්නකින් තොරව සමෘද්ධිමත් හා නිදහසින් යුතු දේශයක් කිසිසේත් බිහි නොවන්නේ ය. ජාත්‍යන්තර හා කාලීන නව ලෝකය හමුවේ පවතින ප්‍රවණතාවන් හා බැඳී ක්‍රියා කළයුතු වුවද අපේම වූ විසඳුම්, යෝජනා හා ක්‍රියාකාරකම් යළි පුබුදුවා ගත යුතු වන්නේ ය. ඒ සඳහා ප්‍රතිපත්ති මත පදනම් වූ නායකත්වය මගින් කළහැකි කාර්යභාරය අතිවිශාල වන අතර ඒ සඳහා දැන් කාලය එළඹ තිබේ.



දුරුතු කලඹ දුරුතු කලඹ දුරුතු කලඹ